NCP/PSC/3/2/ Exam (Vවෙළුම)　　　　　　　　　　　　　　　　　　　　2023.09

**අභ්‍යන්තර විභාග නිවේදනය :- 22/2023**

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
උතුරු මැද පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා
උතුරු මැද පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**<u>උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණිය සඳහා වන</u>**

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 (II)</u>**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ දෙවන අර්ධ වාර්ෂිකය තුළ දී පැවැත්වීමට නියමිත **උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය** පැවැත්වීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

**<u>01. ඉල්ලුම් පත්‍ර යොමු කිරීම :-</u>**

මෙම නිවේදනය පරිදි **උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට** පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති **උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්** මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව තමන් විසින් සකස් කර ගත් අයදුම්පත්‍ර **<u>2023.09.30 වෙනි දින හෝ ඊට පෙර</u>** තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත"** වෙත එවිය යුතු බව දන්වමි.

<u>සැ.යු.</u> – **1.** ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත දිනට නොලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. **(අදාළ ශ්‍රේණියට උසස් වූ / අන්තර්ග්‍රහණය වූ ලිපියේ ඡායා පිටපතක් <u>අනිවාර්යයෙන්ම</u> අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

**<u>02. විභාග ගාස්තු :-</u>**

අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් කරන අතර, අනෙක් අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන්**, රු.480/- ක මුදලක්** <u>උතුරු මැද පළාත් සභාවේ අංක : **2003.02.13** අය ශීර්ෂයට බැරවන පරිදි උතුරු මැද පළාතේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපතේ **(එන්සී100) මුල් පිටපත**</u> අයදුම්පත්‍රයේ ඇලවිය යුතුය. (තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගන්නා කුවිතාන්සි හෝ රජයේ ආදායමට මුදල් බැර කරනු ලබන **ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු නොගෙවන බවත්, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිය යුතුය.)**

**<u>03. විභාග ප්‍රවේශ පත්‍ර හා විභාගය පැවැත්වීමේ කොන්දේසි :-</u>**

අපේක්ෂකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ කිසියම් එක් මාධ්‍යයකින් පමණක් පිළිතුරු සැපයිය යුතුය. අයදුම්පතේ සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. **විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු විභාගය පවත්වනු ලබන දිනය කිසිම විටෙක පසුව වෙනස් කරනු නොලැබේ.**

**04.** **<u>අයදුම්පත්‍ර ඉදිරිපත් කර පරීක්ෂණ වලට පෙනී නොසිටීම :-</u>**
විභාගය සඳහා අයදුම්කර නොවැළැක්විය හැකි හේතුවක් මත විභාගයට පෙනී සිටීමට නොහැකිවන්නේ නම්, **තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් හැකිතාක් කල්වේලා ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.** (අදාළ විභාග ප්‍රවේශ පත්‍රය නැවත එවිය යුතුය)
එසේ නොමැතිව **<u>හදිසි අසනීප තත්ත්වයක්</u>** මත පරීක්ෂණ සඳහා පෙනී සිටීමට නොහැකිවුවහොත් ඒ බව **වෛද්‍ය සහතිකයකින් ද, <u>රෝහල් ගතවී නේවාසික ප්‍රතිකාර ලැබුවේ</u>** නම් ඒ බව **දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකයකින් ද සනාථ කළ යුතුය.**

ඉහත පරිදි කල්වේලා ඇතිව හා ප්‍රමාණවත් ලෙස හේතු දැක්වීමක් නොකර විභාගයට පෙනී නොසිටින අයදුම්කරුවන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරනු ලැබේ.

I. පෙනී නොසිටි විභාග අවස්ථාව ඔහුට / ඇයට නියමිත විභාග අවස්ථාවක් ලෙස ගණනය කිරීම.
II. අදාළ විභාග සඳහා දරන ලද පිරිවැයට සාපේක්ෂව අදාළ අයදුම්කරු / අයදුම්කාරියගෙන් ඒකක පිරිවැය අගයක් අයකර ගැනීම.

**05.** ඉහත උපදෙස් හොඳින් කියවා තේරුම් ගෙන ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙසත්, උපදෙස් වලින් බැහැරව ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසත්, අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වන අතර, **<u>ඔබ විසින් ඉල්ලුම්පත් නිර්දේශ කිරීමේදී ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කරන ලෙස ද දන්වමි.</u>**

❖ **නියමිත ආදර්ශ අයදුම්පත උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙන් (www.psc.nc.gov.lk ) භාගත කරගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.**

ජී.කේ.එස්.චන්ද්‍රලතා,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

**<u>උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණිය සඳහා වන</u>**
**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 – (11)</u>**

01. ව්‍යාපෘති කළමනාකරණය ( කාලය - පැය 03 - ලකුණු 100)
- (i) ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම
- (ii) ව්‍යාපෘති කළමනාකරණය
- (iii) ව්‍යාපෘති චක්‍රය
- (iv) ව්‍යාපෘති පිළියෙළ කිරීම සහ විග්‍රහ කිරීම
- (v) ව්‍යාපෘති ඇගයීම
  - පිළි ගෙවුම් කාලය
  - ශුද්ධ වර්තමාන වටිනාකම
  - අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය
  - පිරිවැය ප්‍රතිලාභ අනුපාතය
  - වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය
- (vi) ව්‍යාපෘති සංවිධානය
- (vi) ණයා මිල යොදා ගැනීම

* **<u>අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට</u> ඉල්ලුම් කරනු ලබන පරීක්ෂණය සඳහා අදාළ ශ්‍රේණියට උසස් වී / අන්තර්ග්‍රහණය වී තිබීම <u>අනිවාර්යය වේ.</u>**
**(අදාළ ශ්‍රේණියට උසස් වූ / අන්තර්ග්‍රහණය වූ ලිපියේ ඡායා පිටපතක් <u>අනිවාර්යයෙන්ම</u> අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**